Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

නර්තනය - (දේශීය) II
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

**52 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:
* මෙම ප්‍රශ්න පත්‍රය **I, II** හා **III** වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
* **I** කොටසේ **1** හා **2** ප්‍රශ්න අනිවාර්ය වේ.
* **II** හා **III** කොටස්වලින් **අවම වශයෙන් එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය.
* සෑම ප්‍රශ්නයකම **(i)** කොටසට ලකුණු **06**ක් ද **(ii)** කොටසට ලකුණු **06**ක් ද **(iii)** කොටසට ලකුණු **08**ක් ද වශයෙන් මුළු ලකුණු **20**ක් බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) පහත සඳහන් බෙර පද අතුරින් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරා මහ තනිතිතට අනුව සමගුණ සහ දෙගුණ වශයෙන් ප්‍රස්තාර කරන්න.

(අ) තකට තකට තුද තකට තුරං රං

(ආ) ගුහිතිගදිගිකිට ගිහිතිගදිගි ගුද

(ඉ) තක්කඩ ජික්කඩ තොංගඩ තාංගඩ

(ii) පහත දැක්වෙන කවි පදය අවග්‍රහයෙන් ආරම්භ කර මැදුම් තනිතිතට ප්‍රස්තාර කරන්න.

"අනේ මී මැස්සේ මල් රොන් ගෙන යන රිස්සේ."

(iii) ඉහත (i) කොටස සඳහා තෝරා ගත් සම්ප්‍රදායට අනුව මයුරා වන්නමේ කස්තිරම හෝ ශුද්ධතාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ නාගගජා වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

**2.** දේශීය නර්තන කලාව පිළිබඳ තොරතුරු විමසීමේ දී ඓතිහාසික මූලාශ්‍රය වැදගත් වේ.

(i) අනුරාධපුර යුගයේ නර්තන කලාව බෞද්ධාගමික අවස්ථා සඳහා යොදාගෙන ඇති ආකාරය ලිඛිත සාධක **තුනක්** ඇසුරෙන් පිරික්සන්න.

(ii) ගම්පොළ යුගයේ භාවිත තූර්ය භාණ්ඩ පිළිබඳ තොරතුරු එම යුගයේ රචිත සංදේශ කාව්‍යයක් ඇසුරෙන් විස්තර කරන්න.

(iii) මහනුවර යුගයේ, කවිකාර මඩුව හා ඉලංගම් පන මගින් නර්තන කලාවට සිදු වූ සේවය සාකච්ඡා කරන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න.

## II කොටස

3. සිංහල ශාන්තිකර්ම යනු ගායනය, වාදනය, නර්තනය, නාට්‍යමය පෙළපාළි සහ චාරිත්‍රවිධි සමෝධානය වූවකි.
   (i) කිරිමඩුව ශාන්තිකර්මයෙහි කිරි ඉතිරවීමේ චාරිත්‍රය ගොඩනැගීම සඳහා එහි උපත් කතාවෙන් ලැබෙන පිටිවහල විස්තර කරන්න.
   (ii) වලියක් මංගල්‍යයට සහ කොහොඹා යක් කංකාරි ශාන්තිකර්මයට පොදු නාට්‍යමය පෙළපාළි සහ නර්තනාංග **තුන** බැගින් වෙන්කොට ලියා දක්වන්න.
   (iii) සන්නියකුම ශාන්තිකර්මයේ බෙර වාදන විශේෂතා කරුණු **හතරක්** ඇසුරෙන් විග්‍රහ කරන්න.

4. (i) "ශාන්තිකර්ම ඇදුරා පස්පවින් වැළකුණු නිසි දේහ ලක්ෂණවලින් යුතු අයෙකු විය යුතු ය." බලි ශාන්තිකර්මයේ කාව්‍ය සාහිත්‍ය ඇසුරෙන් පැහැදිලි කරන්න.
   (ii) රටයකුම හෙවත් රිදී යාගය පැවැත්වීමට පෙර තොවිලය නියම කරගැනීම සඳහා කෙරෙන පූර්ව චාරිත්‍රය **සඳහන් කර** මාතර හා බෙන්තර ශෛලීන් දෙකෙහි වෙනස්කම් පැහැදිලි කරන්න.
   (iii) ප්‍රොත්කඩේ යක්කමෙහි භාවිත සතර අභිනය පිළිබඳ සාකච්ඡා කරන්න.

5. (i) සතර බීජාක්ෂර සඳහන් කර එහි උපත, කාව්‍ය සාහිත්‍ය ඇසුරෙන් දක්වන්න.
   (ii) ජන චරිතය නිරූපණය කිරීම සඳහා ගායනය සහ නර්තනය උපයෝගී කරගෙන ඇති ආකාරය විස්තර කරන්න.
   (iii) ගොයම් සහ අරව්වෙට්ටු යන ගැමි නැටුම් මගින් පිළිබිඹුවන සිංහල හා දෙමළ සංස්කෘතික අනන්‍යතා විමසන්න.

## III කොටස

6. පහත සඳහන් වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස්වලට අදාළව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| කාරි | භාග්‍යචන්ද්‍ර | නටක්‍රැකර් |
| උප්පනයි | මහා පීටර් | හංසවිල |
| ඩෙප්පු | මහා අක්බාර් | නිදි කුමරිය |
| පච්චා | රාජා කර්තා | ගිසෙල්ලි |

   (i) **(අ)** කොටස - භරත නාට්‍යම් සම්ප්‍රදායට අයත් පාරිභාෂික නාමය තෝරා එය කෙටියෙන් විස්තර කරන්න.
   (ii) **(ආ)** කොටස - කථක් නර්තන සම්ප්‍රදාය සඳහා අනුග්‍රහය දැක්වූ රජු තෝරා ඔහුගේ දායකත්වය අගයන්න.
   (iii) **(ඉ)** කොටස - ඔඩෙට් චරිතය අයත් බැලේ නාට්‍යය තෝරා එහි ප්‍රධාන සිදුවීම් **තුනක්** විචාරය කරන්න.

7. (i) රංග වින්‍යාසයේ දී අවකාශ භාවිතය හා සම්බන්ධ සංකල්ප **තුනක්** විස්තර කරන්න.
   (ii) සමස්ත ලංකා පාසල් නර්තන තරඟ සිසු ශක්‍යතා සංවර්ධනය සඳහා දායක වේද? කරුණු **තුනක්** ඇසුරින් පිරික්සන්න.
   (iii) ගායනය සහිත බෙර වාදනයේ දී පහත සඳහන් ශිල්ප ක්‍රමයන්හි වැදගත්කම පහදන්න.
   - නිවැරදි අක්ෂර වාදනය
   - හඬ පාලනය
   - තාල අවබෝධය
   - අන්තර් සබඳතා

8. (i) ළමා පෞරුෂ සංවර්ධනය සඳහා රියැලිටි නර්තන වැඩසටහන්හි බලපෑම කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න.
   (ii) සාම්ප්‍රදායික නර්තනය කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම පහත සඳහන් කරුණු ඇසුරින් විස්තර කරන්න.
   - නර්තන අනන්‍යතාව
   - ඇඳුම් පැළඳුම්
   (iii) දේශීය සංස්කෘතියේ පැවැත්ම කෙරෙහි නර්තන කලාව හා බැඳි සාරධර්මයන්හි වැදගත්කම කරුණු **හතරක්** ඇසුරින් අගයන්න.

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

www.PastPapers.WiKi

PAST PAPERS WIKI

Past Papers Wiki

* * *